# ජාතික වනෝද්‍යාන

**ස්වාභාවික සෞන්දර්යයන්ගෙන් පිරිපුන් රටක් ලෙස ලෝපතල අප මව්බිම, ස්වභාවධර්මයෙන් ලද දායාද රැසකි. ස්වාභාවික පරිසරයත්, තුරුලතා ඇළදෙළ හා වනසතුන්ගේ ආරක්ෂාව උදෙසා කැපකෙරුනු වනෝද්‍යාන රැසක් අප රට තුළ ඇති කිරීමට එයද එක් හේතුවක් ලෙස සැලකෙයි.**

මෙරට ජාතික වනෝද්‍යාන අතරින්, ප්‍රධාන වනෝද්‍යාන ගණයේ ලා සැලකෙන වනෝද්‍යාන ප්‍රමාණය 14 කි. විල්පත්තු, උඩවලව, රුහුණු (යාල), යාල නැගෙනහිර, වස්ගමුව, මින්නේරිය, ලාහුගල, මාදුරුඔය, ගල්ඔය, හෝටන්තැන්න, බූන්දල, ලුණුගම්වෙහෙර, සෝමාවතී චෛත්‍යය ඒ අතර වෙයි. මෙය ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 8% පමණ ප්‍රමාණයකි.

ශ්‍රී ලංකාවේ පැරණිතම වනෝද්‍යානයක් වන විල්පත්තුව 1905 වසරේ දී අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත්කෙරුණු අතර 1938 පෙබරවාරි 25 දින ජාතික වනෝද්‍යානයක් බවට නම් කරන ලදී. හෙක්ටයාර 131,693 ක භූමි ප්‍රදේශයක විහිදී ඇති එය පතනශීලී හා කටුපඳුරු සහිත වනාන්තර, කඩොලාන පරිසර, විල්ලු හා වැලි කඳු සහිත පරිසර පද්ධතියකි.

රුහුණු (යාල) වනෝද්‍යානය ද ලොව පතල වනෝද්‍යානයකි. එය කොටස් 5 කින් සමන්විතය. පළමුවන හා දෙවැනි කොටස්වල අතීතය වර්ෂ 1900 දක්වා දිවගියද වනෝද්‍යානයක් ලෙස පළමු පියවර 1938 පෙබරවාරි 25 දින සහ දෙවැනි පියවර 1954 සැප්තැම්බර් 3 වැනි දින ආරම්භ කර තිබේ. තෙවන අදියර 1967 අප්‍රේල් 28 දින ද, සිව්වන පියවර 1969 ඔක්තෝබර් 9 දින හා පස්වන පියවර 1973 ඔක්තෝබර් 5 දින ආරම්භ කර ඇත. වනෝද්‍යානය හෙක්ටයාර් 97,881 කින් සමන්විත වුවද සංචාරක කර්මාන්තය සඳහා විවෘතව පවතින්නේ හෙක්ටයාර් 14,101 ක විශාලත්වයකින් යුත් පළමු කොටස පමණකි.

ජනාදරය දිනූ කුමන කුරුලු පාරාදීසය ද ඇතුළත් වන යාල නැගෙනහිර ජාතික වනෝද්‍යානය අදියර දෙකකින් යුතු වේ. දෙවැනි කොටස 1969 දෙසැම්බර් 26 දින ආරම්භ කළ ද ප්‍රථම කොටස ලෙස නම් කළ ප්‍රදේශය(Bleck 1) 1970 ජනවාරි 2 දින ආරම්භ වූවකි. සම්පූර්ණ ප්‍රදේශය හෙක්ටයාර 18,149 කි.

හෙක්ටයාර 30,821 පුරා විහිදී ඇති උඩවලව ජාතික වනෝද්‍යානය 1972 ජූනි 30 ද බිහිවූවකි. එය ලංකාවේ 5 වැනි ජාතික වනෝද්‍යානයයි. 1907 වසරේ දී අභය භූමියක් බවට පත් වූ වස්ගමුව, 1984 අගෝස්තු 7 ද ජාතික වනෝද්‍යානයක් ලෙස නම් කෙරිණි. එය හෙක්ටයාර 39,322 ක පැතිරී තිබේ.

මින්නේරිය වනෝද්‍යානය 1938 වසරේ සිට අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කළ අතර 1997 අගෝස්තු 12 ද ජාතික වනෝද්‍යානයක් ලෙස නම්කෙරිණි. එය හෙක්ටයාර 8,889 ක භූමි භාගයක පවතී.

ලාහුගල කිතුලක ජාතික වනෝද්‍යානය 1980 ඔක්තෝබර් 31 ද ශ්‍රී ලංකා වනෝද්‍යාන සමූහයට එක් විය. හෙක්ටයාර 1,554 ක භූමි ප්‍රදේශයක පැතිරී ඇති මෙය 1966 වසරේ සිට අභයභූමියක් ලෙස ප්‍රකාශයට පත්කර තිබිණි. හෙක්ටයාර් 51,468 ක භූමි ප්‍රදේශයක් ආවරණය වන මාදුරුඔය ජාතික වනෝද්‍යානයේ ආරම්භය 1983 නොවැම්බර් මස 9 දින සිදුවී තිබේ. මෙම ප්‍රදේශය ආදිවාසී වැදිජනයා ජීවත් වූ ප්‍රදේශයක් ලෙස ද හඳුනාගෙන ඇති ප්‍රදේශයකි.

ගල්ඔය ජාතික වනෝද්‍යානය 1954 පෙබරවාරි 12 ද ආරම්භ වූවක් වන අතර එය හෙක්ටයාර් 25,900 ක පමණ විශාලත්වයකින් යුතු භූමි ප්‍රදේශයකි. ජාතික වනෝද්‍යාන අතර කුරුලු ගහණය අධික කලාපයක් වන බූන්දල ජාතික වනෝද්‍යානය, අභය භූමියක් ලෙස 1969 දී ප්‍රකාශයට පත්වූවකි. එය හෙක්ටයාර් 6 216 ක පැතිර පවතී. 1960 සිට අභයභූමියක්ව පැවති සෝමාවතී චෛත්‍යය අභය භූමිය 1986 සැප්තැම්බර් 2 ද සිට ජාතික වනෝද්‍යානයක් ලෙස නම් කෙරිණි. එය හෙක්ටයාර් 37,762 ක විශාලත්වයකින් යුක්තය.

කඳුකරයේ පිහිටි ලොව සුපතල හෝර්ටන් තැන්න භූමි ප්‍රදේශය බ්‍රිතාන්‍ය පාලන සමයේ සිටම දැඩි අවධානයට ලක්විය. 1873 වසරේදී ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ද නම්කළ මේ භූමිය 1988 මාර්තු 16 ද ජාතික වනෝද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත්කර තිබේ.

වනසතුනට ජීවත්වීමේ අයිතිය රැකදෙන වනෝද්‍යාන තුළ දී අප රටේ ජීවත්වන වන සතුන් දැකබලා ගැනීමට අවස්ථාව සලසා තිබීම මෙරට සංචාරක කර්මාන්තයේ වර්ධනයට විශාල රුකුලක් වී තිබේ. එමෙන්ම වරින්වර නිකුත් කෙරුණු මෙරට මුද්දර තුළින් ද වන සතුන් හා වනෝද්‍යාන අප රටේ මුද්දර ඉතිහාසයට එක්වී ඇති අතර එමගින් ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර අවධානය යොමුකරවීමට හැකිවී තිබීම විශේෂය.

දර්ශන පෙළක් සමග අප රටින් නිකුත් කෙරුණු ප්‍රථම මුද්දර කට්ටලය පස්වන ජෝර්ජ් රාජකීය පාලනය සහිත බ්‍රිතාන්‍ය යටත්විජිත සමයේදී සිදුවූ අතර ඒ යටතේ 1936 ජනවාරි 01 දින 5 වන ජෝර්ජ් රුව සමඟ අලි රංචුවක දසුනක් සහිත ශත 50 ක මුද්දරයක් නිකුත් විය. එය ශ්‍රී ලංකාවේ වන සතුන් පිළිබිඹු වන ප්‍රථම අවස්ථාවයි. 1938 අප්‍රේල් 25 දින එම රූපය 6 ජෝර්ජ් රජුගේ රූපය ද සමඟ නැවත නිකුත් කෙරිණි.

රුහුණු ජාතික වනෝද්‍යානයේ දසුනක් 1954 මැයි 15 දින හා 1958 මැයි 14 දින මුද්දරයට නැගී තිබේ. අප රටේ වනෝද්‍යානවල දැක ගැනීමට ලැබෙන පක්ෂීන් 4 ක් 1966 පෙබරවාරි 5 දින නිකුත් වූ මුද්දර 4 කින් පිළිබිඹු වේ. සැලලිහිනියා, මොණරා, වළිකුකුළා හා කහ කුරුල්ලා එමගින් දිස් වෙයි. ශ්‍රී ලංකාවේ වනසතුන් පිළිබිඹු වන මුද්දර 4 ක් 1970 මැයි 11 දින නිකුත් කර තිබෙන අතර 1981 පෙබරවාරි 10 ද වනසතුන් හතර දෙනෙකු නිරූපිත මුද්දර කට්ටලයක් ද නිකුත්කර තිබේ. 1994 වසරේදී ශ්‍රී ලංකා වනසත්ව හා ස්වාභාවික ආරක්ෂිත සංගමයේ සියබස ද සත්ත්ව මුද්දර තුළින් සැමරීමට ලක්වී ඇති අතර 1986 හා 1998 වර්ෂවල දී ශ්‍රී ලංකා අලි පරපුර ද මුද්දරයෙන් ලෝක අවධානයට ලක්විය.

ශ්‍රී ලංකාවේ ජාතික වනෝද්‍යාන පිළිඹිබුවන මුද්දර පෙළක් ආරම්භය 2006 ජනවාරි 04 දින නිකුත් වූ විල්පත්තු වනෝද්‍යානයේ දර්ශන සිහිගන්වන මුද්දර 4 ක් සමග ආරම්භ විය. මෙම මුද්දර පෙළ තුළින් අප රටේ වනෝද්‍යාන පිළිබඳව ලෝක අවධානය යොමුවනු නොඅනුමානය.

❑

**අනුර සමරවීර**